# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ සංවර්ධනය සැලසුම් ලැයිස්තුව[1]

බිම්බෝම්බ වලින් පීඩිත පළාත් සහ ප්‍රජාවන්ට ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට සංවේදී වූ ව්‍යාපාර සැලසුම්කරණයේදී අවධානයට ගතයුතු කරුණු මෙම සැලසුම් ලැයිස්තුවෙන් හුවා දක්වයි.

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය වෙනස් විශ්ලේෂණය**

- සියලුම දත්ත ස්ත්‍රීපුරුෂ සහ වයස් අනුව වෙන් වෙන් වශයෙන් ක්‍රමානුකූලව එකතු කිරීම් සහ විශ්ලේෂණය කිරීම.
- කාන්තාවන්ගෙ, ගැහැණු ළමුන්ගේ, පිරිමි ළමුන්ගේ සහ පිරිමින්ගේ පහත සඳහන් දෑ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම:
    - විවිධාකාර වූ හැකියාවන් අවශ්‍යතාවයන් හිරිහැර වලට ගොදුරුවීමට ඇති ප්‍රවනතාවයන් සහ වගකීම්.
    - විධි සහ අවිධි යන කොට්ඨාශ දෙකේම ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය වශයෙන් බෙදුණු කම්කරු ශ්‍රමය. වගකීම් සහ ගෘහස්ථයේදී ඒවාට මුහුණදීමට ඇති ක්‍රමෝපායන්.
    - සම්පත් වලට ළගාවීමට ඇති ප්‍රවේශය සහ පාලනය කිරීමට ඇති හැකියාවේ අසමානකම. (උදා: ඉඩම් )
    - තුවාලකරුවන්ගේ ප්‍රමාණය
    - ජීවනෝපායන ක්‍රියාකාරකම් වල යෙදීමට කාලය වැය කිරීමේදී කාන්තාවන් ගැහැණු ළමුන් පිරිමි ළමුන් හා පිරිමින් මුහුණ දෙන බාධක (උදා. ළදරුවන් බලා ගැනීම හෝ අනෙකුත් ගෘහස්ථ වගකීම්)
- තත්ව වාර්තා වලදී සහ සැලසුම් ලිපිලේඛන වල ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය විශ්ලේෂණය පිළිබිඹු කරයි.
- කාන්තාවන් හා පිරිමින් සමීක්ෂණ සහ සංගණන කිරීමට පුහුණු කර බඳවා ගැනීම.

**ප්‍රවේශය**

- පිරිමින්ට හා තරුණ පිරිමි ළමුන්ට මෙන්ම කාන්තාවන්ට හා තරුණ ගැහැණු ළමුන්ට ජීවන උපාය වැඩසටහන් වලට හා ජීවන උපාය සහය සේවා වලට ඇති ප්‍රවේශය.
- කාන්තාවන්ගේ ගැහැණු ළමුන්ගේ පිරිමි ළමුන්ගේ හා පිරිමින්ගේ ප්‍රවේශවීමේ අවකාශය ප්‍රජාව සමග සාකච්ජා මගින් හා ජංගම පරික්ෂා මගින් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම.
- කාන්තාවන්ට හා පිරිමින්ට බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියේ රැකියා අවස්ථා වලට එක හා සමාන ප්‍රවේශ තිබීම.
- සම ප්‍රවේශ අවස්ථා වලට ඇති බාධක විසදීමට හා තීරණ ගැනීමේ භූමිකා වලට පිරිමි හා කාන්තා සම හා සාධාරණ මෙන්ම සාධනීය සහභාගීත්ව අනුග්‍රහය දැක්වීමට අවශ්‍ය උපක්‍රම තිබීම. (මෙහිදී 50% කාන්තාවන් හා 50% පිරිමින් වශයෙන් සිටීම ම අවශ්‍ය නොවේ.) මෙයට බිම්බෝම්බ වලින් විපතට පත් හා ඔවුන් බලා ගන්නා අයද ඇතුළත් වේ.
- ඵලදායි සම්පත් වලට ප්‍රවේශය හා ඒවා පාලනය කළ හැකි අය ගැන සැලකිල්ලක් දක්වයි. (උදා. ඉඩම්, කැලෑ, ජල මාර්ග, වෙළඳපොළ, තාක්ෂණය, ප්‍රාග්ධනය/ ණය පහසුකම් සහ අධ්‍යාපනය/ පුහුණු)

---

[1] GICHD (2008) Linking Mine Action to Development, Guidelines for Policy and Programme Development, page 116-119. Available at: http://www.gichd.org/fileadmin/pdf/ma_development/Guidelines/Guidelines-LMAD-NGOs-19Nov2008.pdf

**අරමුණ**

- ව්‍යාපෘතියේ අරමුණු සාමාන්‍යයෙන් පිරිමින්, කාන්තාවන්, ගැහැණු ළමයින් හා පිරිමි ළමුන්ට උදෙසා දක්වයි.
- ව්‍යාපෘතියේ අරමුණු සාමාන්‍යයෙන් කාන්තාවන් පිරිමින් ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් සහ කොට්ඨාශ දෙකේම අවශ්‍යතා හා ප්‍රමුඛතා දෙස විවරණයේ යෙදි විසඳුම් සොයයි.

**ක්‍රියාකාරකම්**

- යෝජිත ක්‍රියාකාරකම් කාන්තාවන් හා පිරිමින් යන දෙකොට්ඨාශයම සහභාගි කරවා ගැනෙන අතර කාන්තාවන් හෝ පිරිමින්ව වෙනස් කොට නොසලකයි. උදා: වශයෙන් පිරිමි පමණක් දායක කරගත් සම්ප්‍රදායික ගොඩනැගිලි ව්‍යාපෘති කාන්තාවන්ට හා පිරිමින් යන දෙකොට්ඨාශයම ලැබීම තහවුරු කිරීමට පුණරීක්ෂණ කළ යුතුයි.
- රැකියා වලට බඳවා ගැනීම කළ යුත්තේ සුදුසුකම් මත මිස ආකල්ප මත නොවේ. රැකියා අවස්ථා කාන්තාවන් හා පිරිමි යන දෙකොට්ඨාශයම පිළිගනී. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදි මානව සම්පත් ප්‍රතිපත්ති සකසයි.
- සංවර්ධනයේදි හා බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලියෙදි කාන්තාවන් ගැහැණු ළමයි, පිරිමි ළමයි හා පිරිමින් එක හා සමානව ඵල විඳිති.
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය ආකල්පයන් සාමාන්‍යයෙන් භාවිතා කිරීම තහවුරු කිරීමට අමතර ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත. උදා: ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාමාන්‍ය කරුණු සම්බන්ධ ක්‍රම පුහුණු, අමතර පරීක්ෂණ ආදිය

**ක්‍රියාත්මක කරවීම**

- ක්‍රියාත්මක කරවීමේ පාර්ශවයන් උදා. බිම්බෝම්බ හා ERW ක්‍රියාකරුවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මූලප්‍රවාහකගත වීම පිළිබඳ පුහුණුවක් ලබා ඇති සහ හෝ ක්‍රියාත්මක කරවීමේ කාල පරාසය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය නැඹුරුවක් පවත්වාගෙන යැම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රමුඛ කරගත් නිළධාරින් ස්ථානගත කිරීම.
- ක්‍රියාත්මක කරවීමේ පාර්ශවයන් උදා. බිම්බෝම්බ හා ERW ක්‍රියාකරවන්නන් විනය ' නීති පද්ධතියන් පිළිපැදිමට බැඳි සිටි.
- ක්‍රියාකාරකම් වලට ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය සංවේදි උපදේශන ඇතුළත් කර ඇත.
- නිතිපතා නියමිත කාල වකවානුවලදි කාන්තාවන් හා පිරිමින් සමාන සංඛ්‍යාවක් උපදේශන රැස්වීම/ සාකච්ඡා වලට සහභාගි වේ. උදා: බිම්බෝම්බ, ERW ඉවත් කිරීමේදි ප්‍රජාවේ ප්‍රමුඛතා හා ඉවත් කළ පසු බිම්බෝම්බ රහිත ඉඩම් පවරා දීමෙන් පසු පරිහරණය කරන ආකාරය පිළිබඳ තීරණ ගැනිම..
- කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට රැස්වීම් වලට පුහුණුවීම් වලට හා වැඩසටහන් වලට සහභාගි වීමට ඉඩ සැලසෙන සේ ළමා සුරැකුම් හා පවුල් සුරැකීමට අවස්ථා සලසා තිබීම.
- ස්ත්‍රී-පුරුෂ බිම්බෝම්බ පිළිබඳ අධ්‍යාපන හා පුහුණුකරුවන් පුහුණු කර බඳවා ගන්න.
- බිම්බෝම්බ පිළිබඳ පර්යේෂණ අධ්‍යාපන හා කාන්තාවන්ට හා පිරිමින්ට ගැහැණු ළමයින්ට හා පිරිමි ළමයින්ට ලබාගත හැකිවීමට හා ඔවුන් ඉලක්ක කර ගත සුදුසු පරිදි සකස් කළ ඒවා වීමට වගබලා ගන්න.
- කාන්තාවන්ට හා පිරිමින් යන දෙගොල්ලන්ටම සුදුසු හා ළඟාවිය හැකි වේලාවන් හා ස්ථානවල ප්‍රජා රැස්වීම් පැවැත්වීමට වගබලා ගන්න. අවශ්‍ය අවස්ථාවලදි වෙනම උපදේශණ රැස්වීම් පවත්වා කාන්තාවන්ගේ සාධනීය සහභාගීත්වය තහවුරු කරන්න.
- පුහුණු/ අධ්‍යාපන අවස්ථාවලදී ද වෛද්‍ය පහසුකම් සැපයීමේදි ද කාන්තාවන්ට හා පිරිමින්ට වෙන්වූ නවාතැන් පහසුකම් ලබා දීමට කටයුතු කරන්න.
- බිම්බෝම්බ හා ERW වලින් විපතට පත්වූවන්ගේ සංකලන ක්‍රියාදමවලදි කාන්තාවන්ට හා පිරිමින්ට සමව සැලකීමට වගබලා ගන්න.
- කාන්තාවන් හා පිරිමින් යන දෙගොල්ලෝම ක්‍රියාත්මක කරවීමේදී සහභාගී වීම.
- කාන්තාවන්ට හා පිරිමින්ට අවශ්‍ය වෙනස් වූ පහසුකම් වැඩ කිරීම සඳහා සලසා දෙන්න.
- කාන්තාවන්ගේ හා පිරිමින්ගේ පූර්ණ සහභාගීත්වයට ඇති හඳුනාගැනීම් හා බාධක ජයගැනීමට උපකාරිවන ක්‍රමවේද ඇත.

- තරුණ ගැහැණු හා පිරිමි ළමුන්ගේ විශේෂිත වූ අවස්ථා ඉලක්ක කොටගත් වෘත්තීය පුහුණු හා අවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හා ඔවුන්ට ප්‍රායෝගිකව ප්‍රයෝජනයට ගත හැකි සම්ප්‍රදායික කුසලතා ඇතුළු කුසලතා.
- රැකියා අවස්ථා එනම් විධිමත් හා අවිධිමත් සංනිවේදන ධාරා වලින් ප්‍රචාරණය කරන ලද කාන්තාවන්ට හා පිරිමින්ට එක හා සමානව විවෘතව හා ළඟා කරගත හැකි බිම්බෝම්බ හා ERW ක්‍රියාකරුවන් වැනි.
- බල සම්බන්ධතා වල වෙනස හේතු කොට ගෙන ඇතිවන අහිතකර බලපෑම් නිරීක්ෂණය කිරීම. (උදා: කාන්තාවන් සවිබල ගැන්වීමට ප්‍රතිචාර වශයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැඩිවීම. කාන්තා බිම්බෝම්බ ඉවත් කරන නිලධාරීන් බඳවා ගැනීම නිසා ප්‍රජාවේ ප්‍රතිචාර.)
- රැකියා ස්ථාන නිරීක්ෂණය කොට වෙනස් කොට සැලකීමේ අවස්ථා හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය ප්‍රචණ්ඩත්වයට ප්‍රතිකර්ම කිරීම.
- විපතට පත් ප්‍රජාවේ විවිධ වූ තරාතිරම් වල අයගේ සුවිශේෂ වූ අවශ්‍යතා වලට සරිලන සේ ජීවනෝපාය වැඩසටහන් සකස් කොට ඇත. (කාන්තා මූලික ගෘහ. පිරිමි හා ගැහැණු ළමුන්, අවතැන් වූ කාන්තාවන් හා පිරිමින්, වයස්ගත අය බිම්බෝම්බ/ ERW වලින් විපතට පත් අය, කාන්තා හෝ පිරිමි උපකාරිවන්නන් ආදිය.)

**නිරීක්ෂණය හා ඇගයීම.**

- ක්‍රියාකාරකම් වලදී ප්‍රමාණවත් මට්ටමක ස්ත්‍රී පුරුෂ සමබරතාවය තහවුරු කිරීමට ඉලක්ක තැබීම. (උදා. පිරිමි හා කාන්තා සහභාගිවන්නන්ට පංගු ක්‍රමය.)
- නිරීක්ෂණ හා ඇගයීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සංවේදී නිර්නායක තිබීම එනම් ස්ත්‍රී පුරුෂ සංවේදී නිර්නායක මගින් කාන්තාවන් හා පිරිමින් උදෙසා ඇති ක්‍රියාකාරකම් වල ධනාත්මක හා ඍණාත්මක බලපෑම් මැනිය යුතු වේ. නිර්නායක ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක විය හැක.
- සමාජය තුළ ඇති ස්ත්‍රී-පුරුෂ භූමිකා හා සම්බන්ධතා විය හැකි අවධානම් ලෙස සලසා ඇත. (උදා. ස්ත්‍රී හෝ පුරුෂයන්ගේ පූර්ණ සහභාගීත්වයන් වැළැක්විය හැකි ආකෘතික හෝ ව්‍යුහාත්මක බාධක)
- මෙම මැදැහත් වීම නිසා ඇතිවිය හැකියැයි සිතන ඍණාත්මක බලපෑම සැලකිල්ලට ගෙන (උදා. කාන්තාවන් වැඩිපුර පැටවේ යැයි සිතන බර හෝ පිරිමින්ගේ සමාජාත්මක තනිවීම.)
- ලිංග මත හා වයස් මත පදනම් වූ ව්‍යාපෘති ආවරණයට හා බලපාන දත්ත එක්කර, විශ්ලේෂණ කොට නිතිපතා වාර්තා කරයි.
- ජීවනෝපාය වැඩසටහන් වල කාන්තාවන් හා පුරුෂයන් යන දෙකොට්ඨාශයම ස්වයං විශ්වාසය හා ලබාදෙන තෘප්තින්ගේ වර්ධනය නිරීක්ෂණය කරයි.
- යම්කිසි බාධක හා අසමානතා සකස් කිරීමට සැලසුම් සකසා ක්‍රියාත්මක කරයි.

**අය වැය**

- යෝජිත මැදිහත් වීමෙන් කාන්තාවන්, පිරිමින්, ගැහැණු ළමයි. හා පිරිමි ළමයි යන සියල්ලම ප්‍රතිලාභ ලැබීමට මූල්‍යය ම දායකත්ව ස්ත්‍රී-පුරුෂ සමාජභාවීමය වශයෙන් සකසා ඇත.
- කාන්තා හා පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීමට විශේෂිත වූ ක්‍රියාකාරකම් වලට අය වැයේ කොටසක් වෙන්කර ඇත. (උදා. ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය සංවේදී පුහුණු ලබාදීමට හෝ කෙටි කාලීන ස්ත්‍රී පුරුෂ සමාජභාවීමය විශේෂඥයින් යොමු කිරීමට.)